00794

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව

උපාධි වැඩසටහන- 3වන මට්ටම

අවසාන පරීක්ෂණය 2023/2024

**EPU3338- මුල් ළමාවිය මධ්‍යස්ථාන සහ ප්‍රාථමික පාසල් කළමණාකරණය කිරීම සහ සැලසුම් කිරීම**

**කාලය - පැය දෙකයි. (02)**

**දිනය - 2025.06.01** **වේලාව - ප.ව.01.30 - ප.ව.03.30 දක්වා**

---

I වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, II වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

## I - වන කොටස

01. "සංවිධාන ව්‍යුහයන් සකස් කිරීමට පෙර කළමණාකරුවෙකු විසින් සලකා බැලිය යුතු සහ හඳුනාගත යුතු ප්‍රධාන අංග 6 ක් Robbins (1992) විසින් හඳුන්වා දී ඇත." ඉන් එකක් **(01)** උදාහරණ සමඟින් පැහැදිලි කරන්න.

02. නායකත්ව ශෛලීන් තුනක් **(03)** ලියා ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

03. ශ්‍රී ලංකාවේ ප්‍රාථමික පාසල් පන්ති කාමරයේ ඉගෙනුම් පරිසරය යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද?

04. පෙර පාසල තුළ ගුරුවරු තක්සේරු වාර්තා ඵලදායී ලෙස භාවිත කරන්නේ කෙසේද?

05. ප්‍රාථමික පාසල් ගුරුවරුන් සතුවිය යුතු යහපත් ගුණාංග පහක් **(05)** ලැයිස්තුගත කර ඒවා කෙටියෙන් විස්තර කරන්න.

06. "පෙර පාසල් ගුරුවරුන් වෘත්තීය ගුරු පුහුණු වැඩසටහන් සඳහා නිතර සහභාගී විය යුතුයි." ඉහත ප්‍රකාශය සමඟ ඔබ එකඟද? සාධක තුනක් **(03)** සමඟ ඔබගේ පිළිතුර සාධාරණීකරණය කරන්න.

07. පෙර පාසල් හෝ ප්‍රාථමික පාසල් ගුරුවරුන් පන්ති කාමර පසුබිම තුළ, ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේදී පාරිසරික සම්පත් ප්‍රයෝජනයට ගන්නේ කෙසේද? කෙටියෙන් විස්තර කරන්න.

08. පෙර පාසල් ගුරුවරුන් පෙර පාසල තුළ මූල්‍ය සම්පත් ඵලදායී ලෙස කළමනාකරණය කරන්නේ කෙසේද?

ලකුණු 05 X 08 =40



81

## II - වන කොටස

09. I. "කළමනාකරණය" යන යෙදුම නිර්වචනය කරන්න. (ලකුණු 05 )

II. පෙර පාසල් හෝ ප්‍රාථමික පාසල් ගුරුවරයෙකු ලෙස, ඔබ පන්ති කාමරය තුළ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාකාරකම් සංවිධානය කිරීමේදී සහ ක්‍රියාත්මක කිරීමේදී සලකා බැලිය යුතු සාධක මොනවාද? (ලකුණු 07 )

III. පෙර පාසලේ හෝ ප්‍රාථමික පාසලේ ඉගෙනුම් ක්‍රියාකාරකම් පූර්ව සැලසුම් කිරීමේ වැදගත්කම යෝග්‍ය උදාහරණ හතරක් (04) සමඟින් විස්තර කරන්න. (ලකුණු 08 )

10. I. නායකත්වය පිළිබඳ ගතිලක්ෂණ හා චර්යාවාදී න්‍යාය විමර්ශනය කරන්න. (ලකුණු 08 )

II. මෙම න්‍යායන් දෙක අතුරින් ප්‍රාථමික පන්ති කළමනාකරණය සඳහා වඩාත් සුදුසු යැයි ඔබ යෝජනා කරන න්‍යාය කුමක්ද? කරුණු ඉදිරිපත් කරමින් ඔබේ පිළිතුර සාධාරණීකරණය කරන්න. (ලකුණු 12 )

11. I. පෙර පාසලේ හෝ ප්‍රාථමික පාසලේ මානව සම්පත් යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද? (ලකුණු 05 )

II. පෙර පාසලේ හෝ ප්‍රාථමික පාසලේ මානව සම්පත් සංවර්ධනයේ වැදගත්කම උදාහරණ හතරක් (04) සමඟ සාකච්ඡා කරන්න. (ලකුණු 07 )

III. ශ්‍රී ලංකාවේ වෘත්තීය ගුරු සංවර්ධන වැඩසටහන් පිළිබඳ රජයේ කාර්යභාරය විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න. (ලකුණු 08 )

12. I. "නායකත්වය" යන යෙදුම නිර්වචනය කරන්න. (ලකුණු 05 )

II. ඔබ හොඳ නායකයෙක් හඳුනා ගැනීමේදී සලකා බැලිය යුතු කරුණු පහක් (05) ලියා ඉන් එකක් (01) උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 08 )

III. නායකත්ව ගුණාංග පහක් (05) ලැයිස්තුගත කර ඒවායින් දෙකක් (02) විස්තර කරන්න. (ලකුණු 07 )

13. පහත සඳහන් ඕනෑම දෙකක් (02) ගැන කෙටි සටහන් ලියන්න.

I. පෙර පාසලේ හෝ ප්‍රාථමික පාසලේ ප්‍රජා සම්පත්
II. පෙර පාසලේ හෝ ප්‍රාථමික පාසලේ භෞතික සම්පත් භාවිත කිරීම.
III. පෙර පාසලේ ගෘහස්ථ ඉගෙනුම් පරිසරය
IV. ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සහ සංවිධානය කිරීම අතර සම්බන්ධතාවය (10 X 02= ලකුණු 20)

*-සියලුම හිමිකම් ඇවිරිණි.-*